# චන්දදායකයා ඡන්දපොළට නොයෑමේ රහස




*මාග්‍රට් තැචර් මහත්මිය 1979 බ්‍රිතාන්‍ය මැතිවරණයේදී ඇය තරඟ කළ ලන්ඩනයේ ෆින්ච්ලි ආසනයේ ඡන්ද පොළකට ඡන්දය ප්‍රකාශකිරීම පිණිස පැමිණි අවස්ථාවයි මේ. ඒ මැතිවරණයේදී ඇය නායිකාව වූ කොන්සර්වේටිව් පක්ෂය දිනූ අතර තැචර් මහත්මිය බ්‍රිතාන්‍යයේ ප්‍රථම අගමැතිවරිය ලෙස පත්වූවාය. '*

**ම**හමැතිවරණ උණුසුම ශ්‍රී ලංකාවෙන් ඉවත්වීමත් සමගම මහා බ්‍රිතාන්‍යයේ මැතිවරණ උණුසුම පැතිර පැවතුණි. ශ්‍රී ලාංකිකයෝ මැතිවරණ උද්දාමයෙන් යුතුව දහස් ගණනින් ඡන්ද රැස්වීම් වලට එක්වූවා සේම බ්‍රිතාන්‍ය වැසියෝද නව තාක්ෂණ මහිම යෙන් කෙරෙන මැතිවරණ වාද විවාද නැරඹීමට රූපවාහිනී යන්ත්‍ර කරා රොක්වූහ. මැති වරණ පිළිබඳ කොතරම් උනන්දු වුවත් ඡන්දය දා ඡන්දපොළට ගොස් ඡන්දය නොදමන්නේ නම් මැතිවරණයක නියම ප්‍රතිඵල ගිණිය නොහැක. මහජන කැමැත් කෙබඳුදැයි දැකිය නොහැක. ඡන්දය දීමේ ප්‍රතිශතය ඉතා වැදගත්ය. ශ්‍රීලංකාවේ ඡන්දය දීමේ ප්‍රතිශතය ඉතා ඉහළ වුවද පසුගිය මහ මැතිවරණයේදී සංසන්දනාත්මකව එය ඉතා පහළ අංකයක් ගෙන තිබුණි. ජනපතිවරණයේදී පවා 78 % වූ ඡන්දය දීමේ ප්‍රතිශතය මහ මැතිවරණයේදී 59 % දක්වා පහළ බැස තිබුණි. බ්‍රිතාන්‍ය මැතිවරණයේදී මෙවර ඡන්දය දීමේ ප්‍රතිශතය 61 % වී තිබුණි.

බොහෝ දේශපාලන පක්ෂ සිය ඡන්දදායකයනට ආයාචනා කරන්නේ ඡන්ද පොළට ගොස් ඡන්දය දෙන ලෙසය. මැතිවරණය ගැන උනන්දුවක් දැක්වූවත් ඡන්දය දීමට මැලිකමක් දැක්වීම පිළිබඳව සිතිය හැකි හේතු ගණනාවකි. එනම්

1. ඡන්දය ලබාදීමට තරම් සුදුස්සෙකු නොවීම.
2. කවුරු දිනුවත් සිදුවන යහපතක් නැතැයි සිතීම.
3. ඡන්දය දිනූ පසු ඡන්දදායකයාගේ අදහස් අනුව ක්‍රියා නොකොට පෞද්ගලික වාසි තකා මන්ත්‍රීවරු කටයුතුකිරීම.
4. චන්දපොළ ආශ්‍රිතව විවිධ බලපෑම්වලට යටත්වීම.
5. අපේක්ෂකයන්ගේ විවිධ ප්‍රතික්‍රියාකාරකම් වලට යටවීම.
6. චන්දයදීම සඳහා අවශ්‍ය හැඳිනුම්පත් චන්ද නිල පත්‍රිකා වැනි ලිපි ලේඛන නොමැතිවීම.
7. චන්දපොළට යාමේ අපහසුකම.
8. ඡන්දය දින තම දෛනික ජීවනෝපාය කරගෙන යෑමේ අවශ්‍යතාව.
9. අසනීප හෝ ආබාධිත අයවලුන් වෙනුවෙන් ලබාදෙන පහසුකම් ලබාගැන්මේ අපහසුතා.
10. තැපැල් ඡන්දදායකයනට තම තැපැල් ඡන්දය ලබාගැන්මේ ක්‍රමවේද ව්‍යාකූලවීම.

මීට අමතර විදේශ තානාපති කාර්‍යාලවල සාමාජිකයන්ටද, මැද පෙරදිග, යුරෝපය වැනි රටවල සේවය කරන ශ්‍රීලාංකිකයන් ලක්ෂ 12 කට ද ඡන්දය දීමට ක්‍රම කිසිවක් සකස්කර නැත.

ඡන්දය ප්‍රකාශකිරීමේ ක්‍රමවේද තරමක් ව්‍යාකූලවීම ඡන්ද ප්‍රතිශතය පහළබැසීමට හේතුවකි. පක්ෂයට ඡන්දය දීම, මනාප ලකුණුකිරීම, අපේක්ෂකයන් තුන්දෙනෙකුට ඡන්දය ලකුණු කිරීමේ හැකියාව ආදී කරුණු තරමක් ව්‍යාකූල වන්නාසේම ඉදිරිපත්වූ පක්ෂ සහ ඒවායේ අපේක්ෂකයන්ගේ ප්‍රමාණයද ඉහළයෑම ශ්‍රී ලංකාවේ ඡන්දදායකයාට තවමත් ගැටළුවක්ව පවතී.

පසුගිය මහ මැතිවරණයේදී නරක්වූ ඡන්ද ප්‍රතිශතය 6.9% කි. සංඛ්‍යාවෙන් එය ලක්ෂ 6කට ආසන්නය. මේ අපතේ යන ඡන්ද ප්‍රමාණයන්ද සමස්ථ ප්‍රතිඵලයට බලපා ඇත.

ලංකාවේ අඩුම වැඩි ඡන්ද ප්‍රමාණය වාර්තාවන්නේ 1960 මාර්තු මැතිවරණයේදී තෙල්දෙනිය ආසනයේ ජයග්‍රාහක ආර්. බී. කපුකොටුව ජයග්‍රහණය කළේ වැඩි ඡන්ද 11 කිනි. එසේම 1947 මැතිවරණයේදී වැලිමඩ අපුන කේ. බී. සුගතදාස විසින් ජයග්‍රහණයකරන ලද්දේ වැඩි ඡන්ද 27 කිනි. මෑතක 2001 මැතිවරණයේදී නුවරඑළිය දිස්ත්‍රික්කයේ රේණුකා හේරත්ට ඡන්ද 64 ක් අඩුවීමෙන් මන්ත්‍රීධූරය අහිමි විය.

2005 ජනපතිවරණයේ දී උතුරු නැගෙණහිර පෙදෙස්වල ඡන්දය පාවිච්චිකර තිබුණේ 10% කටත් අඩුවෙනි. ඡන්දදායකයින් ඡන්දය දැමීමට ගියේ නම් එවර සමස්ථ ප්‍රතිපලම වෙනස්වීමට තිබුණේය.

ඡන්දයදීම සඳහා රජයේ පෞද්ගලික අංශයේ අයට වැටුප් සහිත නිවාඩු ලැබුණද ඔවුන් බොහෝ දෙනෙකු ගියේ නැතිබව පෙනේ. ධීවර කර්මාන්තය, වෙළඳාම, කුලී වැඩ වැනි දෛනික ජීවිකා වන්හි යෙදෙන අය ඡන්දය දීමට මැලිකමක් දක්වන්නේ එයට ගිය හොත් දවසේ ආදායම අහිමිවන නිසාය. සාමාන්‍ය ඡන්දය පවත්වන දිනයක දී ශ්‍රීලංකාව පුරා ඇති රෝහල්වල නේවාසිකව ඉන්නා රෝගීන්ට ඡන්දය පාවිච්චි කිරීමට ඉඩක් නැත.

මහා බ්‍රිතාන්‍යය, ඇමරිකාව, කැනඩාව වැනි රටවල විදේශගතව සිටියද ඡන්දය දීමට ක්‍රම සහ විධි සලසා තිබේ. ඔස්ට්‍රේලියාවේ ඡන්දයදීම අනිවාර්ය කර ඇති අතර, එය නොදැම්මොත් දඩයකටද යටත්වීමට සිදුවේ.

ශ්‍රීලංකාවේ නියම මහජන මතය දැනගැනීමට ඡන්දයදීමේ වැදගත්කම ජනතාවට පෙන්වා දීමට දේශපාලකයින් වෙහෙස ගතයුතුය. ඡන්දදායකයාද තමාට හිමි මාහැඟි වරම අත් නොහැර චන්දය දීමට චන්ද පොළට පැමිණිය යුතු වන්නේය.

***ශ්‍රීලංකා පාර්ලිමේන්තුවේ හිටපු නියෝජ්‍ය වේත්‍රධාරී***
**♦ මේජර් වී. බී. කරුණාරත්න**
**Oxford UK**

එක්සත් රාජධානියේ ක්‍රොයිඩන්හි
තේම්ස් බෞද්ධ විහාරාධිපති
පූජ්‍ය පහළගම සෝමරත්න නාහිමියන්ගේ
ජන්මදිනය වෙනුවෙනි.



**දිගුකල්**
**දිනේවා!**
**ගරුතර**
**නා සමිඳ!**

පන්සල හොඳයි සිය දහසකට නිර තුරු
සේවය කරයි දෙස බස රැස රැකෙන යුරු
දහසක් යොදුන් දුර වුව රකින ගුරු වරු
නාහිමි හොඳයි රට දැය රකින නිර තුරු

සැප ඇති හිමිවරුන් අතරේදි වඩා සැප
පිං ඇති තෙරවරුන් අතරේදි උතුම් සැප
නැණ ගුණ සපිරි පින්බර සාසනේ කැප
වීමෙන් රකියි තම උරුමය සිතා සැප

සපිරුණු සූ සැටක් වස් ඇති වෙසක් මසේ
පැහැබර වත කමල දුටුවේද සිත් ලෙසේ
ඇසුරක් ලැබීමත් පෙරවූ පිනක් ලෙසේ
ඔබ දැකුමත් දැනුණි මගෙ වාසනා ලෙසේ

දැකුමෙන් කතාවෙන් සිත්ගන්නා නිතර
බොරුවෙන් මුලා කරනා වදනකින් තොර
සඟ පිළිවෙත් පුරණ නිසි දැනුමෙන් සතර
ඇසුරෙන් හොඳ ඇසුර නාහිමිගේ ඇසුර

ලොව සසුනඹර සුරගුරු තරුවකි දිලෙන
පෙරපර දෙදිග සම්බුදු දහම පතුරන
මා හිමි පදවි ලැබ මතු දින ලක් දෙරණ
පතනෙමි දිගාසිරි! සියවස් පසු කරන

***රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති***
**♦ පූජ්‍ය පන්නල සුමේධ ස්ථවිර**

# Mobile phone usage
# ජංගම දුරකතන භාවිතය

### Number of Mobile phones used in the following countries

1. China - 765,970,000
2. India - 584,323,402
3. USA - 285,610,580
4. Russia - 208,330,000
5. Brazil - 176,700,000
6. Indonesia- 140,200,000
7. Japan - 107,490,000
8. Germany - 107,000,000
9. Pakistan - 97,579,940
10. Italy - 88,580,000
11. Mexico - 83,500,000
12. UK - 75,750,000
13. Vietnam - 70,000,000
14. Philippines - 67,900,000
15. Turkey - 66,000,000

ලෝකයේ ජංගම දුරකතන භාවිතාකරන රටවල් අතුරින් අංක **1** ට සිටින්නේ චීනයයි. දෙවන ස්ථානයේ සිටින්නේ ඉන්දියාවයි. ඇමරිකාව තුන්වන ස්ථානයේය. මුළු ලෝකයේම අද ඇති ජංගම දුරකතන සංඛ්‍යාව **4,600,000,000** බව ගණන් බලා ඇත.



කොළඹ පදික වේදිකාවක යාචකයෙක් මොබයිල් දුරකතන සංවාදයක

